Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

**2023** PUBLIC EXAMINATION

# Sinhala

## Continuers Level

**Wednesday 18 October: 2 pm Australian Eastern Daylight Time**

Reading Time: 10 minutes
Working Time: 2 hours and 30 minutes

- *You have 10 minutes to read all the papers and to familiarise yourself with the requirements of the questions. You must not write during this time.*
- *Monolingual and/or bilingual printed dictionaries may be consulted during the reading time and also during the examination.*

## Section 1: Listening and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 40 minutes for Section 1.
2. Write all your answers to the questions in Section 1 in this booklet in black or blue pen. Space is provided for you to make notes.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*© Victorian Curriculum and Assessment Authority 2023*

**Part A** (Questions 1–3)
(15 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

---

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings of each text. You may make notes at any time.

Listen carefully to each text and then answer the questions in ENGLISH.

**Marks**

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 1**

1. State four experiences a first time customer to the 'Hiru Tharu' would enjoy. **4**

Marks

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 2**

2. (a) Why is the Sigiriya considered an amazing man-made construction? **3**

(b) Provide two views on the origin of the kingdom of Sigiriya. **2**

Marks

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 3**

3. What benefits do the organisers and presenters of the exhibition provide for young people? **6**

**Part B** (Questions 4–6)
(15 marks)

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings of each text. You may make notes at any time.

Listen carefully to each text and then answer the questions in SINHALA.

**Marks**

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 4**

4. (a) What made the race in which Ranathunga Karunananda participated very special? **1**

රණතුංග කරුනානන්ද සහභාගි වූ තරගය සුවිශේෂී වූයේ කුමක් නිසා ද?

(b) How did the Japanese acknowledge the Sri Lankan athlete? **3**

ජපන් ජාතිකයන් ශ්‍රී ලාංකීය මලල ක්‍රීඩකයාට ප්‍රතිචාර දැක්වූයේ කෙසේ ද?

Marks

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 5**

5. (a) What special features are included in Kavinda's vehicle? **2**

කාවින්දගේ වාහනයේ ඇති සුවිශේෂී ලක්ෂණ මොනවා ද?

(b) Why does Shamalee want to postpone the purchase of a new car? **3**

ශාමලී අලුත් මෝටර් රථයක් මිලදී ගැනීම කල් දමන්නේ ඇයි?

Marks | You may make notes in this space. These notes will NOT be assessed.

**Text 6**

6. How do the names given to three specific folk verses mentioned in the text relate to the situations in which they were sung? **6**

මෙම ඡේදයේ සඳහන් වන විශේෂිත ජනකවි වර්ග තුනක් සඳහා දී ඇති නම්, ඒවා ගායනා කරන ලද අවස්ථාවලට සම්බන්ධ වන්නේ කෙසේද?

**End of Section 1**

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

# 2023 PUBLIC EXAMINATION

# Sinhala
## Continuers Level

## Section 2: Reading and Responding (25 marks)

**Instructions to Students**

1. Allow approximately 1 hour and 10 minutes for Section 2.
2. Write all your answers to the questions in Section 2 in this booklet in black or blue pen.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

© Victorian Curriculum and Assessment Authority 2023

**Part A** (Questions 7–8)
(10 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts (for example, by comparing, contrasting, summarising and/or evaluating) and convey the information appropriately.*

---

7. Read the text and then answer in ENGLISH the question that follows.

**සාම්ප්‍රදායික නූල් රූකඩ නාට්‍ය**

සාම්ප්‍රදායික නූල් රූකඩ නාට්‍ය ශ්‍රී ලංකාවේ දකුණු සහ බටහිර වෙරළබඩ ප්‍රදේශවල ප්‍රසිද්ධ කලාවකි. මේ ප්‍රදේශවල ජීවත්වන ගම්වාරි පරම්පරාවට අයිති කලාකරුවන් විසින් මේ රූකඩ නාට්‍ය ඉදිරිපත් කෙරේ. මේවායින් ජාතක කතා සහ ඉතිහාසගත සිදුවීම් සරලව ඉදිරිපත් කෙරෙන නිසා ඕනෑම වයස් කාණ්ඩයක අයට මේවා නරඹා විනෝද විය හැක. සමහර රූකඩ නාට්‍යවල ගැමි ජනතාවට ආවේණික වූ අවිහිංසක විහිළු තහළු සහ උපදේශාත්මක පණිවුඩ ඇතුළත් වේ. ඒවායින් කාටත් ගෞරවයෙන් සහ කරුණාවෙන් සැලකිය යුතු ආකාරය නරඹන්නන්ට උගන්වයි. නූල් රූකඩ නාට්‍ය ආරම්භ වූයේ කවදාදැයි අපැහැදිළි නමුත් මේවාට සියවස් කිහිපයක ඉතිහාසයක් ඇතැයි සැලකේ. ඉන්දියාවේ දකුණු හෝ නිරිතදිග ප්‍රදේශවල සිට ශ්‍රී ලංකාවට පැමිණි සංක්‍රමණිකයන් විසින් මෙම කලාව ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන්නට ඇති බවට විශ්වාස කෙරේ.

ප්‍රවීණ රූකඩ ශිල්පීන් විසින් ලී වලින් රූකඩවල කොටස් කපා, ඔප දමා, තීන්ත ගා, ශරීර කොටස් එකට සම්බන්ධ කරනු ලබයි. එම පවුල්වල කාන්තාවන් අතින් රූකඩවලට ගැලපෙන ඇඳුම් මසා ඇන්දවීමත්, ඒවාට අවශ්‍ය අනෙකුත් සැරසිලි දැමීමත් සිදු කෙරේ. මේ නිසා නරඹන්නන්ට ලංකාවේ සුවිශේෂී සංස්කෘතික උරුමයක් වන රූකඩ නාට්‍ය සංදර්ශන නැරඹීමට අවස්ථාවක් ලැබේ.

රූකඩ නාට්‍ය ප්‍රසංග පවත්වනු ලබන්නේ පොදු ස්ථාන වලයි. මේ නිසා සාමූහිකව විනෝදවීමට සහ විවේක ගැනීමට නරඹන්නන්ට අවස්ථාවක් ලැබේ. එමගින් සමාජ සබඳතා ගොඩනගා ගැනීමට සහ වැඩි දියුණු කරගැනීමට ඔවුන්ට හැකිවේ.

QUESTION

**Marks**

How do Sri Lankans benefit from the traditional string puppetry performances? **5**

8. Read the text and then answer in ENGLISH the question that follows.

## කඩොලාන පරිසර පද්ධති

**නිවේදිකාව:** ආයුබෝවන්! අද අප සමග සාකච්ඡාවට ඇවිත් ඉන්නේ වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රචාරක නිලධාරිනී රම්‍යා පෙරේරා මහත්මියයි.

**රම්‍යා පෙරේරා:** ආයුබෝවන්!

**නිවේදිකාව:** මුහුදු වෙරළට ආසන්නයේ කළපුවල දැකිය හැකි කඩොලාන පරිසර පද්ධති ගැන වැදගත් පණිවුඩයක් අද ඔබ ගෙනැවිත් තියෙනවා නේද?

**රම්‍යා පෙරේරා:** ඔව්, මේ කඩොලාන පරිසරයේ තියෙන ශාකවල වැදගත්කම හුගක් අය දන්නේ නෑ. මේ ශාක තියෙන වෙරළ තීරය ඉතා දැකුම්කළු නිසා සංචාරකයන් මේවා බලන්න එනවා. ඒ වගේම මේ ශාක සුළං ආවරණයක් වගේ වැඩ කරන නිසා තද සුළං වලින් ඇතිවන වෙරළ ඛාදනය අඩු කරනවා.

**නිවේදිකාව:** එතකොට මේ පරිසරයේ තියෙන්නේ කඩොලාන වර්ගයේ ශාක විතරක්ම ද?

**රම්‍යා පෙරේරා:** ඒ විතරක් නෙමෙයි, මුහුදු තණකොළ සහ කොරල්පර ආදියත්, නොයෙක් වර්ගයේ මාළුන් සහ වෙනත් ජීවීනුත් මේවායේ දකින්න පුළුවන්. මේ ශාක හා සතුන්ගෙන් පරිසරයට එකතුවන පෝෂ්‍ය ද්‍රව්‍ය ආහාරයට ගන්නා ඉතා කුඩා ජලජ ජීවීනුත් මේවායේ බහුලව ඉන්නවා.

**නිවේදිකාව:** කඩොලාන පරිසරයේ මෙවැනි ජීව විවිධත්වයක් තිබීම අපිට ලොකු වාසනාවක්.

**රම්‍යා පෙරේරා:** ඔව්, ඔබ දන්නව ද කඩොලාන ශාකවල මුල්වලින් පිටවෙන ඔක්සිජන් ජලයට එකතුවෙනවා වගේම කඩොලාන ශාකවල මුල්වලින් ජලයේ දියවී තියෙන විෂ ද්‍රව්‍ය උරා ගන්නා නිසා ජලය පිරිසිදුවීමකුත් වෙනවා කියලා? මේ නිසා මාළුන් සහ වෙනත් ජලජ සතුන්ගේ බෝවීමට සහ ජීවත්වීමට සුදුසු පරිසරයක් ඒ අවට තියෙනවා. මාළු බහුලව සිටීම නිසා මාළු ඇල්ලීම රැකියාවක් විදිහට කරන අයට මේ පරිසරය ඉතා වැදගත්.

**නිවේදිකාව:** මේ කෙටි කාලය තුළ කඩොලාන පරිසර පද්ධතියේ ඇති වැදගත්කම පිළිබඳව අපව දැනුවත් කළාට බොහෝම ස්තූතියි!

**රම්‍යා පෙරේරා:** ස්තූතියි!

QUESTION

**Marks**

Explain the ecological and economic benefits of the mangrove ecosystem. **5**

Ecological benefits of the mangrove system

- 
- 
- 

Economic benefits of the mangrove system

- 
- 



PLEASE TURN OVER

**Part B** (Question 9)
(15 marks)

---

*Your response will be assessed on how well you:*
- *demonstrate an understanding of the stimulus text*
- *write text appropriate and relevant to context, purpose and audience*
- *structure and sequence information and ideas*
- *manipulate language structures and vocabulary in Sinhala.*

---

9. Read the text and then answer the question in approximately 150 words in SINHALA on page 8.

**'මල්වතු ඔය' ප්‍රතිසංස්කරණය සඳහා ශ්‍රමදානයක්**

'මල්වතු ඔය යෞවන පදනම' මගින් අවට ප්‍රදේශයන්හි ගොවි ජනතාවට ජලය සපයා දෙන ප්‍රධානම ඔය වන පුරාණ මල්වතු ඔය ප්‍රතිසංස්කරණය කිරීමේ ශ්‍රමදානයක් සංවිධානය කර ඇත.

'සැල්වීනියා' නම් වන ජලජ ශාකය බෝවීම නිසා මෙහි ජල මට්ටම සීඝ්‍රයෙන් අඩු වෙමින් පවතී.

ජල හිඟයෙන් ප්‍රදේශවාසීන් බේරා ගැනීමේ අරමුණින් පැවැත්වෙන මෙම ශ්‍රමදානය කුමන අන්දමේ කාලගුණික තත්ත්වයක් යටතේ වුවත් පැවැත්වීමට නියමිතය. සහභාගී වන අයට කෙටි ආහාර සහ පානීය ජලය සපයන අතර මේ සඳහා ඔබගේ දායකත්වයත් අගය කරමු. ශ්‍රමදානයට සහභාගීවීම සඳහා පෙර පළපුරුද්දක් අවශ්‍ය නොවන නිසා මෙයට සහභාගීවන ලෙස ඔබ සැමටම ආරාධනා කර සිටිමු!

<u>එදිනට නියමිත වැඩ සටහන</u>

- ඔය දෙපස ඇති රක්ෂිත වනය පරීක්ෂා කර, විනාශ වී ඇති ගස් වෙනුවට අලුතෙන් පැළ රෝපණය කිරීම
- ඔය අවට එකතු වී ඇති කුණු කසළ ඉවත් කිරීම (මේ සඳහා පරිසර අධිකාරියේ සහාය ලැබීමට නියමිතයි)
- 'සැල්වීනියා' ඉවත් කිරීමට පැමිණෙන විශේෂිත පුහුණුවක් ඇති කණ්ඩායමට කෑම බීම වලින් සංග්‍රහ කිරීම

දිනය: අප්‍රේල් හත්වෙනි සෙනසුරාදා උදෑසන 7:00 සිට සවස 5:00 දක්වා (මෙම කාල පරාසය තුළ කැමති වේලාවක සහභාගී විය හැක.)

QUESTION

You have participated in the working bee mentioned in the notice above. Write a letter to a friend about the personal experience you have gained from participating in the working bee to restore the Malwathu River.

මල්වතු ඔය ප්‍රතිසංස්කරණය සඳහා පැවැත්වූ ඉහත සඳහන් ශ්‍රමදානයට සහභාගී වීමට ඔබට හැකි විය. එහිදී ඔබ ලැබූ පෞද්ගලික අත්දැකීම් සඳහන් කරමින් ඔබේ යහළුවෙකුට/යෙහෙළියකට ලිපියක් ලියන්න.

You may make notes in this space. These notes will NOT be assessed.

*Do not remove this page from the question booklet.*

Student/Registration Number

Centre Number

Sinhala Continuers Level

Question 9

**End of Section 2**

BLANK PAGE

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

## 2023 Public Examination

# Sinhala
## Continuers Level

### Section 3: Writing in Sinhala (20 marks)

**Instructions to Students**

1. Allow approximately 40 minutes for Section 3.
2. Write your answer to a question from Section 3 in this booklet in black or blue pen. Space is provided for you to make notes.
3. You must answer ONE question in SINHALA.
4. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
5. All question booklets will be collected at the end of the examination.

© Victorian Curriculum and Assessment Authority 2023

**Section 3** (Questions 10–12)
(20 marks)

---

*Your response will be assessed on how well you:*

- *demonstrate depth of treatment of information, ideas and/or opinions*
- *write text appropriate and relevant to context, purpose and audience*
- *structure and sequence information and ideas*
- *manipulate language structures and vocabulary in Sinhala.*

---

Answer ONE question from this section in approximately 250 words in SINHALA.

10. You have recently watched a film that depicted how a student's future was shaped by the influence of a good teacher. Write a film review for a school magazine in which you persuade others to watch the film.

    ශිෂ්‍යයකුගේ අනාගතය හැඩගැස්වීම සඳහා හොඳ ගුරුවරයෙකුට කළ හැකි බලපෑම නිරූපණය කෙරුණු චිත්‍රපටයක් මෑතකදී ඔබට නැරඹීමට හැකිවිය. එය නැරඹීම සඳහා අන් අයව පොළඹවමින් පාසල් යෞවන සඟරාවකට චිත්‍රපට විචාරයක් ලියන්න.

11. You have found a large envelope in your mailbox before Christmas with an invitation to attend Christmas celebrations at the North Pole. Write an imaginative short story for a young writers' competition about what happened next.

    නත්තලට පෙර, නිවසේ ලියුම් පෙට්ටිය විවෘත කළවිට උත්තර ධ්‍රැවයේ නත්තල සැමරීමට ඔබට කර තිබූ ආරාධනාවක් සහිත විශාල ලියුම් කවරයක් හමුවිය. ඉන් අනතුරුව සිදුවූයේ කුමක් ද යන්න පිළිබඳව තරුණ ලේඛකයින්ගේ තරගයකට මනඃකල්පිත කෙටි කතාවක් ලියන්න.

12. You have recently attended an Invention Trade Show and Exhibition. Write an article for the science section of a newspaper in which you evaluate an invention that impressed you.

    මෑතකදී ඔබ නව නිර්මාණ ඇතුළත් වෙළඳ ප්‍රදර්ශනයක් නැරඹීමට ගිය අතර එහිදී ඔබ දුටු සිත් ඇදගත් නිර්මාණයක් ඇගයීමට ලක්කරමින් පුවත්පතක විද්‍යා තීරුවට ලිපියක් ලියන්න.

You may make notes in this space. These notes will NOT be assessed.

Question Number:

PLEASE TURN OVER

**End of Section 3**